# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

## BCOM E1015 - කළමනාකරණ මූලධර්ම

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. " සමාජයට සේවය කිරීමට සංවිධාන අවශ්‍ය වන අතර, සංවිධාන තම අභිමතාර්ථ කෙරෙහි සාර්ථකව ඉටුකර ගන්නේද යන්න රඳා පවත්නේ කළමනාකරණය මතය. "

සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

ආ. කළමනාකරණ මට්ටම මත කළමනාකරණ කුසලතාවයන්ගේ වැදගත්කම වෙනස්වන්නේ කෙසේද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. අ. " අතීත සිදුවීම් නැවත සිදු නොවේ. එම නිසා අතීත කළමනාකරණ න්‍යායයන් ඉගෙනීමෙන් ප්‍රයෝජනයක් නොමැත." ඔබ එකඟ වන්නේද ? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. පද්ධති න්‍යාය කෙටියෙන් පැහැදිලි කර කළමනාකරුවකුට එහි ඇති ප්‍රයෝජනය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

03. අ. බොහෝ විට සැලසුම්කරණය කළමනාකරණ ශ්‍රිත අතරින් ප්‍රාථමික ශ්‍රිතය වශයෙන් හඳුන්වන්නේ ඇයි.

(ලකුණු 05)

ආ. විධිමත් සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ. "ශදූඅත" විශ්ලේෂණයන් වැදගත්වන්නේ ඇයි.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. "සංවිධානකරණය යනු සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියයි." සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරීමේ මූලිකාංග පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20)

05. අ. "අභිප්‍රේරණය සම්බන්ධයෙන් මැස්ලෝ සහ හර්ස්බර්ග් යන දෙදෙනාගේම දායකත්වයන් අතර සමානකම් මෙන්ම වෙනස්කම්ද ඇත." සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ ශ්‍රමික නොසන්සුන්තාවයට අභිප්‍රේරණය සම්බන්ධ ගැටළු දායක වී ඇතැයි කීම නිවැරදි ද ? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. අ. කළමනාකරුවන් සඳහා සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කරන්න. ඵලදායි සංනිවේදනයකට ඇති බාධක කවරේද ?

(ලකුණු 10)

ආ. "සමාජීය වගකීම් (CSR) කාර්යයන් මත වියදම් දැරීමමුදල් නාස්ති කිරීමකි." මෙම කියමන හා ඔබ එකඟ වන්නේද ? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07. කෙටි සටහන් ලියන්න.

අ. අරමුණු මත කළමනාකරණය

ආ. පූර්ණ නායකත්වය

ඇ. ගතිලාංග න්‍යාය

ඉ. පාලන ක්‍රියාවලිය

(එක් කොටසකට ලකුණු 05)

(මුළු ලකුණු 20)